# ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය වර්තමාන සමාජය තුළින් වියැකීමට බලපාන හේතු සහ සංස්කෘතික උරුමයක් ලෙස එය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

**ජී.ජී. හෂාන් ජයවික්‍රම**[1]

ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය ආකාශ වස්තුන්ගේ චලනය හා සාපේක්ෂ පිහිටීම අධ්‍යයනය කිරීමෙන් මානව කටයුතු හා භූමිය තුළ සිදුවන විශේෂ තොරතුරු පිළිබඳව ප්‍රකාශ කරන අව්‍යාජ විද්‍යාවක් ලෙස දැක්විය හැකිය. එසේම මෙය ක්‍රිස්තු පූර්ව දෙ වැනි ශතවර්ෂයට අයත් වේ. ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය සංස්කෘතික උරුමයක් වන අතර, වර්තමානය වන විට විවිධ හේතු මත පරිහානිකර තත්ත්වයකට පත්ව ඇත. මෙම පර්යේෂණ පත්‍රිකාව තුළින් අවධානය යොමු කරන්නේ ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය පරිහානියට බලපාන හේතු සාධක සහ සංස්කෘතික උරුමයක් ලෙස ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රමවේදයන් මොනවාද යන්න විමර්ශනය කිරීමය. සෙසු අරමුණු ලෙස පුද්ගලයන්ගේ විශ්වාසය ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය සමඟ සම්බන්ධ වන ආකාරය අධ්‍යයනය කර ඇත. මේ සඳහා පූජාපිටිය ප්‍රදේශය අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස තෝරාගෙන ඇති අතර ප්‍රශ්නාවලි සියයකින් දත්ත රැස්කරන ලදී. මෙම දත්ත අධ්‍යයනයේදී ජ්‍යෝතිෂ් ශාස්ත්‍රයේ පරිහානිකර සාධක ලෙස තාක්ෂණය ජ්‍යෝතිෂ් ශාස්ත්‍රයට බද්ධ කිරීම, මුදල් ඉපයීම මුල් කරගනිමින් පුද්ගලයන්ට අව්‍යාජ තොරතුරු සැපයීම, පූජා කර්ම හා මිල අධික යන්ත්‍ර මන්ත්‍ර පැළඳීමට උපදෙස් ලබාදීම, පුද්ගලයින්ගේ පෞද්ගලික තොරතුරු බාහිර පුද්ගලයන් අතට පත්කිරීමට සැලැස්වීම සහ එමගින් අයුතු ප්‍රයෝජන ලබාගැනීමට උත්සාහ කිරීම, විවිධ මැතිවරණ කාල තුළ දේශපාලයන්ගේ දේශපාලනික අභිමතාර්ථ පූර්ණ කිරීමට අනාවැකි පළකිරීම හා ඒවා අසත්‍ය වීම, ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය හා බැඳි ඇති චාරිත්‍ර වාරිත්‍ර ප්‍රතික්ෂේප කර නව චාරිත්‍ර විධි ඇතුල් කිරීම ආදි පරිහානිකර තත්ත්වයන් හඳුනාගත හැකිය. ඉහත සඳහන් කරන ලද සාධක මත ජෝතිර්වේදය අභාවයට යන ලකුණු පහළ වී ඇත. නමුත් මෙම ක්‍රමවේදය වෙනස් කරමින් සමාජය තුළ ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය සංස්කෘතික උරුමයක් ලෙස ස්ථාපනය කිරීම සඳහා පහත ක්‍රමවේදයන් යෝජනා කෙරේ. උසස් පෙළ විෂය නිර්දේශයට ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය අන්තර්ගත කිරීම, විශ්වවිද්‍යාල පද්ධතියට ජ්‍යාතිෂ වේදය විෂයක් ලෙස හඳුන්වා දීම, ජෝතිර්වේදය විධිමත්ව අධ්‍යයන කළ හැකි නීත්‍යානුකූල ආයතන නිර්මාණය කිරීම, සම්ප්‍රදායිකව ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය ක්‍රියාවට නංවන ජ්‍යෝතිෂ්‍යවේදීන් ජාතික ක්‍රියාවලිය තුළ ලියාපදිංචි කිරීම, විධිමත් ජ්‍යාතීර්වේදීන් මඟින් කාලීන වැඩසටහන් නිර්මාණය, ජ්‍යෝතිෂ්‍යවේදීන් දේශපාලන අතකොළු බවට පත්නොවී කටයුතු කිරීමට අවශ්‍ය නීතිමය ක්‍රියාවලිය ප්‍රතිෂ්ඨාපනය කිරීම. යෝජිත ක්‍රමවේද හරහා ජ්‍යාතිෂවේදය සංස්කෘතික උරුමයක් ලෙස පරිහානියට පත්වීම වළක්වා ගත හැකි අතර, එය සංස්කෘතික උරුමයක් ලෙස සමාජය තුළ ප්‍රතිස්ථාපනයට අවශ්‍ය මූලික පියවර ගොඩනැගිය හැකිය. මෙහිදී නිගමනය කළහැක්කේ නව තාක්‍ෂණික වර්ධනය සහ පුද්ගලයා මුදල මත පදනම් වීම නිසා ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය පරිහානියට ලක්ව ඇති බවයි.

ප්‍රමුඛ පද : ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය, පරිහානිය, සංස්කෘතික උරුමය, ප්‍රතිෂ්ඨාපනය

---

[1] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. hashankingswood1w@gmail.com